රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>

**1.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
**------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2017** දෙසැම්බර් **31** දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ**.**

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**
**-----------------------------------**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** ඉකුත් වර්ෂයේ අක්කර බදු රු. 21,625 ක් වැඩිපුර දක්වා තිබීම 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද එය නිවැරදි කර නොතිබුණි.

**(ආ)** කර්මාන්ත 205 ක නිමි වැඩ වටිනාකම රු. 74,926,656 කින් රු.56,387,812 ක් වර්ෂයේ ආදායම් හා ණය ගැතියෝ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. තවද වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ණය හිමියෝ රු. 56,697,732 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ)** ඉකුත් වර්ෂවල නිමකරන ලද කර්මාන්ත වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු. 40,701,447 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

**(ඈ)** ඉකුත් වර්ෂවල නිමකරන ලද කර්මාන්ත වලට අදාලව ගෙවා තිබුණු රු. 29,558,412 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

**(ඉ)** අයවිය යුතු අක්කර බදු රු. 209,053 ක් වුවද රු. 77,026 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අයවිය යුතු අක්කර බදු රු. 132,027 කින් අඩුවෙන් දැක්වුණි.

**(ඊ)** ලැබියයුතු බලපත්‍ර ගාස්තු රු. 46,510 ක් හා ලැබිය යුතු ව්‍යාපාර බදු රු.47,400 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු හා ක්‍රීඩාංගනය කුලියට දීමේ ගාස්තු වශයෙන් 2015 වර්ෂයේ සිට 2017 ජූලි දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබී තිබූ රු. 624,613 ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 11 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.132,325,909 ක් හා ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂ එකතුව රු.114,307,707 ක් වූයෙන් රු.18,018,202 ක වෙනසක් විය.

**(ආ)** 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල වටිනාකම රු.276,212,099 ක් වුවත් ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.275,337,038 ක් වූයෙන් රු.875,061 ක වෙනසක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**--------------------**

2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.18,981 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට රු. 3,147,302 ක් දක්වා වැඩි වී තිබූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

**(අ) ලැබිය යුතු ගිණුම්**

**-------------------**

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 27,991,629 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

-----------------------

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.685,489 ක් විය.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**-------------------------------------------------------**

වටිනාකම රු.1,484,025 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් තහවුරු කරගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.4 අනුකූල නොවීම්**

**------------------**

**1.4.1 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ.371(2) | 13,829 | අවස්ථා 10 කදී ලබාදී තිබුණු අත්තිකාරම් දින 14 සිට දින 77 දක්වා ප්‍රමාද වී පියවා තිබුණි. |
| (ii) මු.රෙ. 371(5) | 625,651 | 2006 වර්ෂයේ නිකුත් කර තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි |
| (iii) මු.රෙ. 396 (ඈ) | 21,354 | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ.571 | 4,888,380 | 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ ආපසු නොගෙවූ රු. 4,458,377 ක් වූ විවිධ තැන්පත් හා රු.430,003 ක් වූ ටෙන්ඩර් ඇප සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (v) මු.රෙ.1646 | | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සභාවේ වාහන 20 කට අදාල ධාවන සටහන් වර්ෂ ගණනාවකින් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,853,382 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,849,459 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම රු. 000 | බිල් කළ ආදායම රු. 000 | රැස් කළ ආදායම රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 | ඇස්තමේන්තුගත ආදායම රු . 000 | බිල් කළ ආදායම රු. 000 | රැස් කළ ආදායම රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 3,288 | 3,288 | 3,543 | 1,516 | 3,488 | 3,488 | 4,351 | 2,185 |
| (ii) | කුලී | 9,362 | 7,338 | 6,879 | 3,002 | 6,211 | 6,211 | 7,042 | 1,670 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 370 | 250 | 393 | 77 | 320 | 320 | 427 | 94 |
| (iv) | වෙනත් ආදායම් | 3,455 | 8,499 | 8,499 | - | 3,371 | 3,371 | 4,969 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසැඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 8,6 හා 146 කින් වැඩි වී තිබූ අතර කුලී ආදායම අයවැගත ප්‍රමාණයට වඩා සියයට 27 කින් අඩු වී තිබුණි**.**

### 2.2.3 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු හා අක්කර බදු ගෙවීම් පැහැර හරින විටදී අදාළ ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන හෝ මුදල් අයකරගත යුතු වුවත් වර්ෂ 01 ට වැඩි හිඟ වරිපනම් බදු රු.841,933 ක් හා අක්කර බදු රු.192,531 ක් සම්බන්ධයෙන් අදාල පරිදි කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

පොදු වෙළඳපල මස් කඩ හා මාළු කඩ බදු දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.833,264 ක හිඟ කුලී පැවතුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

දීර්ඝ කාලයක සිට අයනොවී පවතින රු. 77,398 ක් වූ බලපත්‍ර ගාස්තු හා රු. 60,292 ක් වූ ව්‍යාපාර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව නඩු පවරා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

**2.2.6 වෙනත් ආදායම්**

**(අ) සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වූ ගාස්තු**

සභා බලප්‍රදේශය තුළ පවතින සංවර්ධනය නොකළ ඉඩම්වල ප්‍රාග්ධන වටිනාකමින් සියයට 0.5 ක බද්දක් අයකර ගැනීමට ගැසට් නිවේදනය පළකර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එවැනි ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් කර බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

**(ආ) දැන්වීම් පුවරු ගාස්තු**

සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන පෝස්ටර් ,කටවුට් හා බැනර් පිළිබඳව හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණු අතර දැන්වීම් පුවරු ගාස්තු ගෙවන ලෙස දන්වා යවා තිබුණු ලිපි අනුව රු. 81,950 ක ආදායම් අයවීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

විවිධ ආයතන වලින් නියමිත කාර්යයන් ඉටු කිරීම සඳහා ලබා දී තිබූ රු. 1,440,212 ක් අදාල කාර්යයන් වල යෙදවීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.18,089,500 ක් වැයකර ඉදල්පොල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර නොදිරන කසළ බැහැර කිරීමට සභාවට ස්ථානයක් නොමැතිවීම නිසා පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි. සභාව සතුව ගලි බවුසරයක් තිබුණද මළ අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැති වීම හේතුවෙන් සේවාලාභීන්ට මළ අපහරණය කිරීමේ පහසුකම ලබාදීමට නොහැකි වී තිබුණි. දැනට පවත්වාගෙන යන කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ජල පහසුකම් හා තෙකලා විදුලිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

වසර 2030 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාව සතුව පුළුල් දැනුමක් නොතිබුණු අතර නිශ්චිත තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේ වුවත් තිරසාර සංවර්ධන අරමුණුවලට අදාල කාර්ය කටයුතු සිදුකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

2006 හා 2009 වර්ෂ අතර කාල පරිච්ඡේදය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු රු. 103,521 ක් ගෙවීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

ස්ථාන මාරුවී ගිය , විශ්‍රාම ගිය හා සේවය හැරගිය සේවකයන් 07 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අයවිය යුතු සේවක ණය රු.267,283 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

-------------------------------------------

වටිනාකම රු.904,174 ක් වූ වාහන හා යන්ත්‍ර 4 ක් ,වටිනාකම සඳහන් නොවූ කැබ් රථයක් හා ට්‍රේලරයක් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. එකී වාහන හා යන්ත්‍ර අපහරණය කරන ලෙස 2016 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණද ලියාපදිංචි සහතික ඇතුළු නීත්‍යානුකූල ලේඛන අස්ථානගත වීම හෝ වාහන සැපයූ ආයතන වලින් අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම කටයුතු නිමකර නොතිබුණි.

**3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

------------------------------------------------------------

පොදු වෙළඳ සංකීර්ණය පිටුපස මස් හා මාළු කඩ සඳහා කඩ කාමර 06 ක් වෙන් කර තිබුණද එයින් කඩ 02 ක් 2016 වර්ෂයේ සිට 2018 මැයි මස දක්වා වසා දමා තිබීම හේතුවෙන් සභාවට අයකර ගතහැකි ආදායම් අහිමි වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 09 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 3 ක එකතුව රු. 105,000 ක් වූ මුළු ප්‍රතිපාදනය හා වැය විෂයන් 21 ක ප්‍රතිපාදන වලින් සියයට 10 ත් සියයට 88 ත්

අතර ද වශයෙන් එකතුව රු.10,962,337 ක් උපයෝජනය කර නොතිබුණි. වැය විෂයන් 07 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා සියයට 04 සිට සියයට 411 දක්වා රු. 45,904,403 ක් වැය කර තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදුන් වැරදි නිවැරදි නොකිරීම |
| | (ii) | ජර්නල් සටහන් සමඟ ඉදිරිපත් කරන සන්ලක්ෂ පැහැදිලි නොවීම |
| | (iii) | උපලේඛන ගිණුම් සමඟ නොසැසඳීම |
| | (iv) | ලෙජර් ගිණුම නිවැරදිව පිළියෙල කර නොතිබීම |
| | (v) | පොදු තැන්පත් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| (ආ)ආදායම් පරිපාලනය | (i) | හිඟ අදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | (ii) | ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික ලේඛන පවත්වා නොතිබීම |
| (ඇ) අයවැය පාලනය | (i) | ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) | ඇස්තමේන්තු ආදායම් අයකර නොගැනීම |
| (ඇ) වත්කම් පාලනය | (i) | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | (ii) | වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම |
| | (iii) | සභාව භාවිතාකරන වෙනත් ආයතන සතු වාහන පවරාගැනීමට කටයුතු නොකිරීම. |